See discussions, stats, and author profiles for this publication at: https://www.researchgate.net/publication/346032481

# Historical Importance of Kandy and It's peripheral Region

**Chapter** · January 2012

CITATIONS
0

READS
6

1 author:

Thusitha Mendis
89 PUBLICATIONS 1 CITATION

SEE PROFILE

**Some of the authors of this publication are also working on these related projects:**

Project Ancient Human Settlement and Technology of Anuradhapura Deegapashana Area Research project View project

Project Settlement Archaeology of Middle Yan Oya Basin Research Project View project

All content following this page was uploaded by Thusitha Mendis on 20 November 2020.

The user has requested enhancement of the downloaded file.

# පූජ්‍ය ලේඛනී

ඉළුක්කුඹුරේ ශ්‍රී පුඤ්ඤදරතනාභිධාන නාහිමි
අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය

සංස්කරණය
දර්ශනපති අජිත් තලවත්ත

# පූජා ලෝචනී

ඉළුක්කුඹුරේ ශ්‍රී පුඤ්ඤදරතනාභිධාන නාහිමි
අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය


ප්‍රථම මුද්‍රණය - 2012 ජූලි

**සැකසුම සහ මුද්‍රණය**

නෙත්වින් ප්‍රින්ටර්ස් පුද්ගලික සමාගම
අංක 310,
ගම්පොළ පාර,
පේරාදෙණිය.
081-2384639 / 071-4867830

ISBN : 978-955-51904-2-8

## කතු පවත්

1. මහාචාර්ය හඟුරන්කෙත ධීරානන්ද හිමි, B.A. (Hons), M.A. Peradeniya, MSc (Paris) Ph.D. (J.N.U) අංශාධිපති හිමි, ඉතිහාසය අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2. මාහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත්, B.A. (Hons), M.A. Dhilli, Ph.D. (Peradeniya) සමාජ විද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

3. මහාචාර්ය දයා අමරසේකර, B.A. (Hons) M.A. (Peradeniya) Ph.D. (Culture) සමාජ විද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, සමාජ විද්‍යා පිළිබඳ ප්‍රකට ගත් කතුවරයෙකි.

4. අචාර්ය රෝහිත දසනායක, B.A. (Hons) M.S.S.C. (Kalaniya) Ph.d. (Madras) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාසය අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

5. දර්ශනපති, රාජකීය පණ්ඩිත පූජ්‍යපාද මාවතගම පේමානන්ද හිමි, B.A. (Hons) J. pura ,M.A. (Kalaniya) Mphil/J.pura, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රී ලංකා බෞද්ධ පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම.

6. අධ්‍යාපනපති කහගල සීලානන්ද හිමි B.A. (Peradeniya) Ed. Dip. With Merit, Medන මධ්‍යම පළාත් නැණෝදා අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතියේ උපදේශක හා පිළිමතලාව ධීරානන්ද මහා විද්‍යාලයේ ආචාර්ය, ජනමාධ්‍ය ප්‍රවෘත්ති අමාත්‍යතුමාගේ උපදේශක.

7. ආචාර්ය තුසිත මෙන්ඩිස් B.A. (Hons) Dip. (PGIAR) Dip. (PGIAR) Mphil (PGIAR) Ph.D. (PGIAR), Ra, SAAC, මධ්‍යම සංස්කෘතික අරමුදල මහනුවර ව්‍යාපෘති කලමණාකරු.

8. ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත දැරංගල කුසලඥාණ හිමි, B.A. (Hons) M.A. (Kelaniya),බාහිර කථිකාචාර්ය පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, පේරාදෙණිය. කථිකාචාර්ය ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමි පල්ලේකැලේ.

9. ශාස්ත්‍රපති,රාජකීය පණ්ඩිත වැම්පිට ඉන්දවිමල හිමි, (M:A.Kalaniya), ආචාර්ය, මහ විහාර මහා පිරිවෙන, අස්ගිරිය.

# මහනුවර හා තදශ්‍රිත ප්‍රදේශයේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වැදගත්කම

ඩී. තුසිත මැන්දිස්

## ප්‍රවේශය

ශ්‍රී ලංකාවේ ඉතිහාසය රචනා කරන ලද ගිහි පැවිදි විද්වතුන් අනුරාධපුරය හා මාගම මුල් කරගත් ජනාවාස පදනමින් ගොඩනැගූ ශිෂ්ටාචාරයට අයත් තොරතුරු ලේඛනගත කොට තිබෙන අතර සුවිශේෂී පාරිසරික හා භූරූපනයකින් සුසැදි මහනුවර හා තදශ්‍රිත ප්‍රදේශයේ ජනාවාස තත්වයන් ආන්තීකරණයකට ලක්කොට තිබෙන ආකාරය මධ්‍යම ඓතිහාසික අවධියේ රචිත සාහිත්‍යය මූලාශ්‍රවලින් පැහැදිලි වේ. ඒ නිසා ම මහනුවර හා තදශ්‍රිත ප්‍රදේශයේ ඉතිහාසය පිළිබඳ බොහෝ විද්වතුන් සාකච්ඡාවට බඳුන් කොට ඇත්තේ ක්‍රි. ව. 1357 සිට ක්‍රි. ව. 1815 බ්‍රිතාන්‍යය කිරීටයට යටත් වූ ඉතිහාසයකට හිමිකම් කියන භෞමික ප්‍රදේශයන් ලෙස ය (Senavirathne 1983:25).

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ලේඛනගත වී ඇති සම්භාව්‍ය සාහිත්‍ය මූලාශ්‍රයන්හි කඳුරට හඳුන්වා ඇත්තේ **මලය, මලය රට්ඨය, මහා මලය රට්ඨය** යනුවෙනි (මව,vii : 68 ; චූව. 70 : 3-5) සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් වන ඉහත නාමයන් තුළින් කන්ද, උස් භූමිය යන අරුත දෙන **මලෙයි** යන වචනයෙන් බිඳී ආ **මලය** යන්න සහස්වස්තුවේ හඳුන්වා ඇත්තේ **ගිරි මණ්ඩලය** යනුවෙනි (සහවස් : 83 - 94) මූලාශ්‍රයන්හි අන්තර්ගත නාම විශේෂණ අනුව මධ්‍යම කඳුකරය ශ්‍රී ලංකාවේ සුවිශේෂී භෞමික පාරිසරික ක්ෂේත්‍රයන් ලෙස හඳුන්වා ඇති බව පැහැදිලි වුව ද මහවංසයේ සහ සහස්වස්තුවේ මලය රට හඳුන්වා ඇත්තේ **පුලින්ද, ව්‍යාධ, මිලක්ඛ, මනුස්ස, උපචරක** යන ජනතාව වාසය කරන හුදෙකලා ප්‍රදේශයන් ලෙස ය (එම). මධ්‍යම කඳුකරය ගැන විස්තර කරන මූලවංශය එහි භෞතික පිහිටීම දක්වා ඇත්තේ මෙසේ ය ***"එය විශාල කඳුවලින් බහුල ය,***

*තරණය කිරීමට අපහසු ය, රුදුරු සතුන් ජීවත් වන ප්‍රදේශයකි. එහි තුළ වසන මිනිසුන් පවා බොහෝ දුරට හුදෙකලා ජීවිත ගත කරති. ගමන් කළ හැක්කේ අඩි පාරවල් ඔස්සේ පමණි, මිනීකන කිඹුලන් හා ගැඹුරු ජලජ ස්ථාන එහි පිහිටා ඇත'' (මූව. 70 ; 3 5).*

ඓතිහාසික සම්භාව්‍ය සාහිත්‍ය ලේඛනයන් මගින් දක්වා තිබෙන විස්තර ඔස්සේ ද ආන්තිකකරණයට ලක්කරනු ලැබූ මධ්‍යම කඳුකරය සම්බන්ධ ව ඉතා මෑතක් වන තෙක් ම පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික අධ්‍යනයන් සිදුවූයේ ඉතා සීමිත වශයෙනි. සම්භාව්‍ය ලේඛන තුළින් පවා පසුගාමී සමාජයන් හට සීමා වී තිබූ බව දක්වා ඇති මෙම භෞමික ක්ෂේත්‍රයේ ඇති වැදගත්කම හඳුනාගනු වස් දියත් කරන ලද පුරා සමාජ. හා පුරා පරිසර විද්‍යා අධ්‍යයන අනුව මධ්‍යම කඳුකරය හුදෙකලා විවේකී ප්‍රදේශයක් වශයෙන් නොතිබූ බව ග්‍රහණය කරගෙන ඇත. මෙම රචනය මගින් පෙන්වාදීමට උත්සාහ කරනු ලබන්නේ ලිඛිත ඉතිහාසය තුළ ආන්තිකරණයට ලක්කර තිබූ මධ්‍යම කඳුකරය විශේෂයෙන් ම මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශය ඉතා අති පුරාණයේ සිටම මානව පැවැත්ම හා මානව ක්‍රියාකාරකම්වලට උපයෝගී වූ භූමියක් ලෙස පැවතී ඇති බව පෙන්වා දීම ය.

## මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශයේ පුරා සමාජ ක්‍රියාකාරීත්වය හා සම්පත් පරිහරණය

මධ්‍යම කඳුකරය ආශ්‍රිත ආදි ජනතාවගේ පදිංචි වීමේ මෝස්තරය පිළිබඳ ව විමර්ශන කිරීමේ දී එම තත්වය ප්‍රාග් ඓතිහාසික අවධියේ සිට ආරම්භ වන බව බටදොඹලෙන, බටතොටලෙන, රත්නපුර, දෙරවක කන්ද ලෙන ආදී ප්‍රාග් ඓතිහාසික ස්ථාන ආශ්‍රිත කැණීම්වලින් වාර්තා වූ මානව සැකිලිවලින් පැහැදිලි වී තිබේ (Deraniyangala 1992). මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශයේ ප්‍රග්ඓතිහාසික මධ්‍ය ශිලා අවධිය නියෝජනය කරන මානව සාධක කෑගල්ල ප්‍රදේශයේ, දෙරවක ලෙනෙන් වාර්තා

වන අතර ගම්පොළ හා පේරාදෙණිය ප්‍රදේශයන් ප්‍රාග් ඓතිහාසික මානවයින් භාවිත කළ මානව කෘතක සාධක වන ශිලා මෙවලම් 1885 වර්ෂයේ දී ඊ. ඊ. ග්‍රීන් (E. E. Green) වාර්තාකොට තිබේ (Sarasin 1926 : 81 Deraniayagola in 1929 : 3). **තිරුවානා හා කහඳ** (quartz & Chart) යන ඛනිජ පාෂාණ උපයෝගී කොටගෙන නිර්මාණය කර ඇති මෙම මෙවලම්වල තාක්ෂණය අනුව බොහෝ විට ඒවා මධ්‍ය ශිලා අවධිය (Mesolithic) නියෝජනය කරන බව උපකල්පනය කළ හැකි වේ. මධ්‍යම කඳුකරයේ ක්‍රියාත්මක වූ දඩයම් හා එකතු කිරීම් සුවිශේෂ (Hanting & gathering) පාරිසරික ව්‍යුහයක් තුළ ස්ථානගත වීම සඳහා ජීවනෝපාය (Subsystem) සඳහා අවශ්‍ය මෙවලම් තනා ගැනීමට යෝග්‍ය වූ සම්පත් මුල් වූ බව ඉතා පැහැදිලි වේ. විශේෂයෙන් ම ඉහළ කඳුකරයේ සිට ගලන ජලධාරා තුළ **තිරුවානා** හා **කහඳ** පාෂාණ පහසුවෙන් සපයාගත හැකි ඛනිජ වේ. දැඩි භාවයෙන් යුත් මෙම පාෂාණ උපයෝගී කොටගෙන ඉතා තියුණු මෙවලම් නිර්මාණය කර ගැනීමට ප්‍රාග්ඓතිහාසික මිනිසුන්ට හැකි වීම නිසා මුළු කඳුකරය පුරාම ප්‍රාග් ඓතිහාසික ජනාවාස ව්‍යාප්ත වීම හඳුනාගත හැකි ය (Deraniyagala 1992 : 2,3,4). එනිසා ම පේරාදෙණිය හා ගම්පොළ යන ප්‍රදේශවල ද ප්‍රාග් ඓතිහාසික ජනාවාස ගොඩ නැගීමට ඇති අතර කඳුකරයේ සිට වියළි තැනිතලාවල පිහිටි විශේෂයෙන් අනුරාධපුරයේ වූ මධ්‍ය ශිලා ජනාවාස මෙම ඛනිජ ද්‍රව්‍ය පරිවහණය වී ඇති බව ඇතුළුපුරයෙන් හා වෙස්සගිරියෙන් වාර්තාවන ද්‍රව්‍යාත්මක ශේෂ මඟින් ද පැහැදිලි වේ.

මහනුවර හා තදාශ්‍රිත සාර්ව භූ කලාපයේ පුරාමානව ජනාවාසකරණය අධ්‍යයනයේ දී ජන පිරිස් හා සම්පත් අතර ඇති වන්නා වූ ඓන්ද්‍රීය සම්බන්ධීකරණයේ ප්‍රතිඵලය පැහැදිලි ව හඳුනාගත හැක්කේ පූර්ව ඓතිහාසික සංස්කෘතික (Proto historic) අවධියෙනි. විශේෂයෙන් ම මහනුවර සානුවේ සිට මාතලේ දක්වා දිවෙන්නා වූ භෞමික ක්ෂේත්‍රය ක්‍රිස්තු පූර්ව 600 -200 කාලය තුළ

විශේෂ මානව ආකර්ෂණයකට ලක්ව ඇති බව පුරාවිද්‍යා පර්යේෂණ මඟින් තහවුරු කරගෙන තිබේ. පූර්ව ඓතිහාසික අවධිය තුළ දී දඹුල්ලේ සිට නාලන්ද හරහා මාතලේ දක්වාත් එතැන සිට මහනුවර දක්වා වූත් වනදුර්ග හා ගිරිදුර්ගවලින් ගහණ වූ ප්‍රදේශයකට මිනිසුන් ප්‍රවිෂ්ට වන්නේ ඛනිජ සම්පත්වලට පැවති ඉල්ලුමට නිසා බව පෙනේ (Senaviratne 1996:282). විශේෂයෙන් ම මාතලේ දිස්ත්‍රික්කයේ සිට ඉහළ කලා ඔය නිම්නය දක්වා පිහිටි උස් භූමි වැටියෙහි තිරුවානා, **කිරිගරුඬ, ශිස්ට්, කැල්ක්නයිස්,** ග්‍රැනයිට්, ගානට්, ෆෙල්ඩස්පාර්, **සිල්මනයිට්, රිදී, තඹ, මිනිරන්** ආදී ඛනිජවලින් පොහොසත් නිධි පිහිටා තිබේ (Cooray : 1984). මීට අමතර ව කුළු බඩු ශාක වර්ධනයට ද මෙම භූමිය තෝතැන්නක් වේ (Senavirathne 1996 : 285).

ක්‍රිස්තු පූර්ව 1000 දී පමණ උතුරුමැද පහත් වියළි හා තැනිතලා ප්‍රදේශවල වාසභූමි ඇතිකරගත් පූර්වඓතිහාසික යුගයේ අර්ධ ස්ථාවර ජන කණ්ඩායම් ඉතා සශ්‍රීක කෘෂි භූමි පසුකර ක්‍රිස්තු පූර්ව 7 වන සියවස පමණ වන විට පහත් කඳුකර කලාපයට ප්‍රවිශ්ට වී වාසභූමි පිහිටුවා ගැනීම සිදු කරනු ලැබේ. මේ තත්ත්වය **ඉබ්බන්කටුව, ගල්වෙල, සීගිරිය, කණ්ඩලම, රොටවැව, ආතෙකටාව** ආදී ප්‍රදේශවල පිහිටුවා ගනු ලැබූ වාස භූමි හා වලළුම් ස්ථානවලින් පැහැදිලි වේ (ibid : 286). ඉබ්බන්කටුවේ සිදුකරනු ලැබූ පොළව මතුපිට විමර්ශනවලින් එම ප්‍රදේශයට ආවේණික නොවන තිරුවානා හා කහඳ පාෂාණ ලැබීමෙන් මාතලේ හෝ මහනුවර සානුවේ සිට ඉහළ කඳුකර කලාපයේ ජනාවාසවල සිට පහත් කඳුකර කලාපයට හුවමාරු මාධ්‍යය ඔස්සේ පැමිණි අමුද්‍රව්‍ය ලෙස හඳුනාගෙන ඇත. පූර්ව ඓතිහාසික අවධියේ ප්‍රාරම්භක යකඩ යුගයේ සමාජ ආශ්‍රිත ව සිදුවූ මෙම ගනුදෙනු ක්‍රියාවලිය සාර්ව ආකාරයෙන් හඳුනාගත හැකි වන්නේ අනුරාධපුරයේ සිදු කරන ලද කුසුද මට්ටමේ පුරාවිද්‍යා අධ්‍යයන මඟිනි සිරාන් දැරණියගල විසින් ඇතුළුපුරයේ සිදු කරනු

ලැබූ කැණීම්වල දී ක්‍රිස්තු පූර්ව 500 පමණ කාලයට අයත් ස්තර තුළින් එම ප්‍රදේශයට ආවේණික නොවන කඳුකරයේ කලාපයේ සම්භවය ලබන **ඇමතෙස්ත** (Amathyst), **කහඳ** (Chart), රබහ (Garnet), **චන්ද්‍රකාන්ත පාෂාණ** (Moonstone), පළිඟු (Crystal), **තෝරමල්ලි** (Tourmaliye), ජැස්පර් (jasper) ආදී ඛනිජ පාෂාණවල බහුල භාවිතයත්, මැණික් කැපීමේ වැඩ, රත්තරන්, තඹ ආදී ද්‍රව්‍යවල සාක්ෂි ලැබීමෙන් මහනුවර හා මාතලේ සානුවේ සිට සිදුවූ ද්‍රව්‍යමය හුවමාරුව මැනවින් පැහැදිලි වේ. මෙම ද්‍රව්‍යමය හුවමාරුව සඳහා ප්‍රාථමික යකඩ යුගයේ දී මහනුවර සිට දඹුල්ල දක්වා විහිදෙන පුරාණ මාර්ග පද්ධතිය මහවැලි නිම්නයේ සිට හුලංගමුව, ගල්ලෙන් වත්ත, අළුවිහාර, තල්ගහගොඩ, අස්ගිරිය, යටවත්ත, ගණේගෙදර, සුළුපානාපහු විහාර, තිලගම, රයිගම ඔස්සේ දඹුල්ල දක්වා ගමන් කොට ඇත (Senavirathne 1996 : 189).

පූර්ව ඓතිහාසික අවධියේ මාතලේ සහ මහනුවර සානුව තුළ වූ සම්පත් පරිහරණ ක්‍රියාවලිය තව දුරටත් මහාපරිමාණ ආකාරයෙන් කල එළි බැසීමට මුල් ඓතිහාසික අවධියේ (Early Historic Period) සිදුවීම හඳුනාගත හැකි ය. දඹුල්ලේ සිට මහනුවර දක්වා විහිදෙන්නා වූ පුරාණ මාර්ගය ඔස්සේ පිහිටා ඇති ප්‍රාග් ක්‍රිස්තු යුගයට අයත් ශිලා ලිපි මඟින් ජනාවාස ස්ථාන, නිෂ්පාදන මධ්‍යස්ථාන හා හුවමාරු මධ්‍යස්ථාන මෙන් ම සම්පත් හැසිරවූ හා අත්පත් කරගත් ජන කණ්ඩායම් ක්‍රියාත්මක වී ඇති ආකාරය හඳුනාගෙන තිබේ. මෙම ජන කණ්ඩායම් ඛනිජ සම්පත් අත්පත් කරගැනීම් හා ඒවා බෙදා හැරීම් සම්බන්ධ ව කාර්යභාරයක නියැලී සිටි බව මැනවින් පැහැදිලි වේ. නාලන්ද මාතලේ, දෙමඩඹය, ගෝනවත්ත, වේගිරි දේවාලය ආදී ස්ථානවල ස්ථානගත වී ඇති ප්‍රාග් කිස්තු යුගයට අයත් මැණික් හා ඛනිජ පාෂාණ ආශ්‍රිත කටයුතුවල නියැළුණු ජන කණ්ඩායම් පිළිබඳ සඳහන් වේ. ඒ අතර දෙමඩඹයෙන් හමුවන ශිලා ලිපියක **මහා චුඩික**

රජු පිළිබඳ ව සඳහන් වේ. මහා වුඩික පදවිය සහිත සටහන් මුල් බ්‍රාහ්මී ශිලා ලිපියක් මහනුවරට ආසන්න ගෝනවත්ත ප්‍රදේශයෙහි ද වාර්තා වී තිබේ. මහා වුඩික පදවිය මගින් **මහා මැණික භාරකරු** ගම්‍ය වන බව පෙන්වා දෙන සෙනවිරත්න මහා වූඩික රජුගේ මැණික්කරුවන් දෙමඩ ඔයට සම්ප්‍රාප්ත වී ඇත්තේ මැණික් ගල් හෝ තලාතු මිනිරන් අත්පත් කර ගැනීමේ උවමනාවෙන් බව පෙන්වා දී තිබේ (Senavirathne 1996 : 193). මෙම තත්ත්වය පිළිබඳ ව විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන කාරණය වන්නේ නාලන්ද ප්‍රදේශයේ සිට මහනුවර හාරගම ප්‍රදේශය දක්වා වූ කලාපයේ ඛනිජ සම්පත්වල පාලන බලය මහා වූඩික රජ පෙළපත දැරූ ප්‍රාදේශිය පාලකයන් සිදු කරන්නට ඇති බව ය. මෙයට අමතර ව වේගිරි දේවාලය ප්‍රදේශයෙන් ලැබෙන සෙල් ලිපිවල සඳහන් මණිකර, වූඩ හා දයීක (දළ කැටයම්කරුවන්) කඳුකර කලාපයේ ඛනිජ හා අනෙකුත් ස්වභාවික සම්පත් ආශ්‍රිත කර්මාන්තවල නියැළුණු පිරිස් ලෙස විශ්වාස කළ හැකි ය (IC. Vol : 1970 : 807).

මෙයට අමතර ව මාතලේ කඳු හරහා මහවැලි ගඟේ මැද නිම්නය තෙක් ම මධ්‍යම කඳුකරයේ සම්පත් අඩංගු ප්‍රදේශ දක්වා සිය ආධිපත්‍යය පැතිරූ පොවුනික රාජ පරම්පරාව ගැන ද තොරතුරු, බඹරගල හා ඇඹුල්අඹේ ප්‍රදේශයෙන් වාර්තා වේ. මෙම පෙළපත නිෂ්පාදන හා බෙදාහැරීම් කෙරෙහි කිසියම් පාලනයක් ක්‍රියාත්මක කරන්නට ඇතැයි සිතිය හැක්කේ මාතලේ අසල උඩුපිහිල්ලේ මැත දී සොයා ගන්නා ලද ගෝලාකාර හැඩයෙන් යුත් පිළිස්සූ මැටි පුවරුවල හිනිමං ලකුණු හා මුල් බ්‍රාහ්මී අකුරෙන් **තිශ** යන්න සඳහන් වීමෙනි. සෙනෙවිරත්න පෙන්වා දී ඇති ආකාරයට **තිශ** යන්නෙන් සඳහන් වන්නේ පොවනි පෙළපතෙහි වංශාවලි අනුක්‍රමණිතාවේ අය **තිශ** නැතහොත් **ගමණී තිශ** විය හැකි බව ය. මෙම කාරණාවලට අමතර ව නාලන්ද ප්‍රදේශයත්, බඹරගලින් හමුවන ශිලා ලිපියක **කොළගම** පිළිබඳ ව සඳහන් වේ. **කොළ්** යන ද්‍රවිඩ වචනයේ තේරුම ගතහොත්

එයින් ලෝහ යන්න ගම්‍ය වන බව පෙන්වා දෙන සෙනෙවිරත්න කොළගම යන්න ලෝහකරුවන් ගම ලෙස අර්ථ දැක්විය හැකි බව පෙන්වා දෙයි (සෙනෙවිරත්න 1996 : 21). බඹරගල සිදු කරනු ලැබූ වර්තමාන භූ සමීක්ෂණ මගින් තඹ හා රිදී පවතින බව පෙන්වා දී තිබීමෙන් අති පුරාණයේ සිටම මේ ප්‍රදේශයේ තිබෙන සම්පත් පිළිබඳ ව දැන සිටි බව මැනවින් ගම්‍ය වේ. එසේ ම අත්පත් කරගත් මෙම ඛනිජ සම්පත් පෙළපත් ප්‍රධානීන්ගේ අධිකාරි බලය යටතේ ග්‍රාම නගර හරහා බෙදා හැරීමට **පූග** හෝ **ශ්‍රේණි** වැනි ඒකාබද්ධ මණ්ඩල ඔස්සේ ක්‍රියාකර ඇති බව හඳුනාගත හැකි ය. මාතලේ අසල කුඩාගල ශිලා ලිපියේ **පූග** වැනි විශේෂ ඒකාබද්ධ මණ්ඩල ගැන සඳහන් වේ (ඩයස් 1991 : 3 - 5). ගෝණකගල හා වැල එල්ලූ ගොඩකන්දෙන් සොයාගත් ලිපිවල ද **පූග** පිළිබඳ සඳහන් වී ඇත (කරුණානායක 1967 : 63). මහින්ද කරුණානායකගේ විග්‍රහ කිරීම් අනුව පූගය එය බලපවත්වන ප්‍රදේශයේ මිනිසුන්ගේ විවිධ කර්මාන්ත වෙළඳාම පිළිබඳ ව සොයා බැලූ ආයතනයක් වේ (එම : 64).

මේ ආකාරයට මධ්‍ය කඳුකරයේ මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශයේ සිට ලබාගත් ඛණිජ හා අනෙකුත් සම්පත් පූග වැනි ඒකාබද්ධ මණ්ඩල ඔස්සේ පහත් කඳුකර කලාපවලට හුවමාරු වීම **ග්‍රාම හා කඩ** ජාලයක්. ඔස්සේ සිදු වී ඇති බව පෙනේ. විශේෂයෙන් ම දඹුල්ල ප්‍රදේශයේ හමුවන ශිලා ලිපි වල එන **උපරිකඩ, මතුකගම** (IC Vol. 1970 : 837) මෙවැනි ද්‍රව්‍ය හුවමාරු ස්ථාන ලෙස සුදර්ශන සෙනෙවිරත්න පෙන්වා දෙයි. ඔහු විග්‍රහ කරන ආකාරයට **කඩ** යන්නෙන් ගම්‍ය වී ඇත්තේ වෙනත් පාරිසරික භූ රූපන සම්පත් කලාප සමග සම්බන්ධ වන නිශ්චිත භූමි ප්‍රදේශයකි. ක්ෂුද්‍ර තත්වයක දී මුල්දී **කඩ** යන්නෙන් කන්දක් හෝ කපොල්ලක් ගම්‍ය වූ අතර මුල් ඓතිහාසික අවධිය වන විට ඒවා සම්පත් එකතු කරන හා භාරගන්නා මධ්‍යස්ථාන වශයෙන් ක්‍රියාත්මක වී තිබේ (සෙනෙවිරත්න : 1996 : 20). මේ අනුව මධ්‍ය කඳුකරය මුල් ඓතිහාසික සමය වන

විට මහා පරිමාණ ආකාරයෙන් දෙස් විදෙස් සම්පත් වෙළඳපොළ වෙත ලබාදුන් ස්ථානයක් බවට පත් වී තිබේ.

**සමාප්තිය**

මූලාශ්‍ර ග්‍රන්ථවල හුදෙකලා විවේකී ප්‍රදේශයන් ලෙස හඳුන්වා ඇති මධ්‍යම කඳුකරය ඊට පටහැනි ලෙස සමාජ සැකසුම සමඟ ඛනිජ සම්පත් භාවිතය මුල්කොට ගත් ආර්ථික වැඩ කටයුතුවලින් පොහොසත් ප්‍රදේශයක් වූ බව දැනට සිදුකොට ඇති පුරාවිද්‍යා අධ්‍යයන මගින් තහවුරු කොට තිබේ. මේ තත්ත්වය කරණ කොටගෙන අමු ද්‍රව්‍ය හා අර්ධ නිමි ද්‍රව්‍ය ලංකාවේ පහත් තැනිතලා ප්‍රදේශවලට ඇදී යාමත් සමග ජනාවාස ධූරාවලි පද්ධතියක් මුල් ඓතිහාසික අවධියේ ඇති වීම සමග ගාම පදනම් කොටගත් ශිෂ්ටාචාරයක් පහත් කඳුකර තලය තුළ බිහි වීම සිදු වේ. එය කඳුකරයේ ඇති සම්පත් පරිහරණ ක්‍රියාවලියේ දී සමාජ, ආර්ථික ව්‍යුහය උපරිමය කරා වර්ධනයට මග පෑදීම නිසා සිදු වූ ක්‍රියාවලියක් ලෙස මේ අනුව පෙන්වා දිය හැකි ය.

**පරිශීලනය කරන ලද ග්‍රන්ථ හා ලිපි නාමාවලිය**

කරුණානායක. එම් 1967 පුග ශ්‍රේණි හා මුදල් 63-76 *ගයිගර් සමරුව* සංස්. ලබුහේන්ගොඩ චන්ද්‍රරත්න, ධාරා පාලි සඟරා, සම්පාදක මණ්ඩලය.

*චූලවංශය*

බු. ව. 2496, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, දොන් ආන්ද්‍රියස් ද සිල්වා බටුවන්තුඩාවේ, තෘතිය මුද්‍රණය, ආණ්ඩුවේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,

ඩයස් එම්. 1991 **අභිලේඛනමය සටහන්**, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

*මහාවංසය*

බු. ව. 2496 , සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, දොන් අන්ද්‍රියස් ද සිල්වා බටුවන්තුඩාවේ, තෘතිය මුද්‍රණය, ආණ්ඩුවේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.
***සහස්සවත්ථුපකරනය***
1959, පොල්වත්තේ බුද්ධත්ත හිමි 1996 උත්තර මලය රටියේ ප්‍රාථමික යකඩ යුගය මගින් සම්පත් පරිහරණයේ ඉතිහාසය,
***ඓතිහාසික මහනුවර,*** ශ්‍රී සුමංගල විද්‍යාලයීය බෞද්ධ සංගමය, මහනුවර
1996 පර්යන්ත ප්‍රදේශ හා ආන්තික ප්‍රජාවෝ ශ්‍රී ලංකාවේ මුල් අයස් සමයේ ද්‍රවය හා සමාජ නාම පිළිබඳ විකල්ප තේරුමක් කරා, පුරාවිද්‍යා අංශය පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය

Deraniyagala S.
1986 - Excavation in the Citadel of Anuradhapura : Gedige 1984, A Preliminary Report, ***Ancient Ceylon*** No 06 42-43, Colombo, Archaeological Survey Department,
Colombo Cooray P. G. 1984, An Introduction to the Geography of Sri Lanka, Colombo, National Museum Colombo
1992 ***The Prehistory of Sri Lanka***, Colombo Archaeological Survey Department, Colombo

Paranavitane, S.
1970 , Inscription of Ceylon Vol .1 Published by the Department of Archeology Ceylon Seneviratne A.
1983 Kandy, Central Cultural , Ministry of Cultural Affairs Sri Lanka Senevirathne S.

1996 peripheral Regions & Marginal Communities Towards & alternative material & Social Formation in ***Tradition Pissent & Ideology Essays in Hondur of Romil Thapar*** edsby K. Champakalaksmi & s Gopal , Oxford University Press, Bembay, Calcuta Madras



View publication stats